# ආබාධිතතා සහිත සිසුන් සඳහා විභාග පහසුකම් සැලසීම

## සාධාරණ ආදේශක

සාධාරණ ආදේශක යනුවෙන් අදහස් කරන්නේ විශේෂඥ උපදේශක කමිටු උපදෙස් මත පදනම්ව ආබාධ සහිත සිසුන්හට පහසුකම් සැලසීම සඳහා ඉදිරිපත් කළහැකි අනුවර්තන හෝ වෙනස්කම්ය. විභාගයේදී තම කාර්යසාධනය මත සැලකිය යුතු බලපෑමක් ඇතිවියහැකි, තාවකාලික, ස්ථිර හෝ දිගුකාලීන ආබාධිත තත්වයක් ඇති සිසුන් හට මෙම සාධාරණ ආදේශක සඳහා වූ උපදේශක කමිටුවට අයදුම්කර විභාග සඳහා පෙනී සිටිමට අවශ්‍ය පහසුකම් ලබාගත හැකිය. සාධාරණ ආදේශක ලබාදීමේ අරමුණ වන්නේ විභාග වලදී ශිෂ්‍යාගේ කාර්ය සාධනය මත තම ආබාධිතතාව මගින් සිදුවිය හැකි බලපෑම ඉවත්කිරීම හෝ අවම කර ගැනීම මගින් තම දැනුම, කුසලතා හා හැකියාවන් නිවැරදිව ප්‍රදර්ශනය කිරීම සඳහා අවස්ථාව ලබාදීමය.

## පටිපාටිය

සාධාරණ ආදේශක ලබාගත යුතු සියලුම සිසුන් ඉල්ලුම්පත්, පීඨ නියෝජිතයන් හරහා, ආබාධ සහිත සිසුන් සඳහාවූ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කළ යුතුය. **අයදුම්පත් විභාගය ආරම්භ කිරීමට මසකට පෙර සැකසිය යුතුය.** සියලුම අයදුම්පත් ආබාධ සහිත සිසුන් සඳහා වූ සම්බන්ධීකරණ මධ්‍යස්ථානයේ උපදේශක කමිටුව විසින් සෙනෙට් සභාව විසින් අනුමත කරන ලද සාධාරණ ආදේශක මාර්ගෝපදේශයට අනුව විමර්ශනය කරනු ඇත. මෙම සාධාරණ ආදේශක ලබාදීමේදී එම විභාගයට පෙනී සිටින අනෙකුත් සිසුන්ට සාපේක්ෂව අබාධිත අයදුම්කරුට කිසිදු අසාධාරණ වාසියක් සැලසීම කිසිම ආකාරයකින් නොවන බව සඳහන් කළ යුතුය.

## සලකා බැලිය යුතු සාධාරණ ආදේශක

සාධාරණ ආදේශක සලකා බැලිය යුතු වන අත්තිවාරම වන්නේ, වත්මන් අධ්‍යාපන ක්‍රමය, ප්‍රතිචාර පටිගත කිරීම සහ ශිෂ්‍යාගේ සන්නිවේදනය වේ. මෙම

ලියවිල්ල තුළ පෙන්වා ඇති සාධාරණ ආදේශක වනුයේ සලකා බැලිය හැකි බව අවම වෙනස්කම් පමණක් අඩංගු මාර්ගෝපදේශ මාලාවක් පමණි. සෑමසිසුවෙකුගේම විභාගයට අදාළ නිශ්චිත අවශ්‍යතා තනි තනිව සලකා බලනු ඇත.

- යම් ශිෂ්‍යයකුගේ ආබාධිතතාව නිසා නිශ්චිත තක්සේරුවක් කිරීමට හෝ යම් සංරචකයක් තක්සේරු කිරීමට නොහැකි වනවිට, උදාහරණ ලෙස දැඩි ලෙස ශ්‍රවණ ඌනතාවයකින් පෙළෙන සිසුවෙකුගේ ශ්‍රවණ (සවන්) සංරචකය තක්සේරු කිරීමේදී, පීඨ මණ්ඩලයයේ අනුමතියට යටත්ව විකල්ප තක්සේරු ක්‍රම සලකා බැලිය හැකිය. විකල්ප තක්සේරු ක්‍රමයක් භාවිතා වී ඇත්නම්, එය ශිෂ්‍යාගේ අධ්‍යන වාර්තා වෙහි නිශ්චිතව සඳහන් කරනු ඇත.

## දෘශ්‍ය අපහසුතා-

- ප්‍රශ්න පත්තර ලබාදීමේදී එය ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ගැළපෙන ආකාරයට ලබාදිය යුතුය. උදාහරණ- බ්රේල් හෝ හඬ ප්‍රතිධාන මෘදුකාංග භාවිතය.
- ප්‍රමාණයෙන් විශාල අකුරින් මුද්‍රිත ප්‍රශ්නපත්‍ර සහ පැවරුම්, මාර්ගෝපදේශ සමගින් දෘශ්‍ය අපහසුතා සහිත ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ලබාදිමට අවශ්‍ය පියවර ගතයුතුය. එවන් ක්‍රමවේදයන් තුලින් ඔවුන්ට ප්‍රතිළාභ ලබාගත හැක.ප්‍රමාණයෙන් විශාල අකුරින් මුද්‍රිත පිටපතේ අකුරුවල විශාලත්වය ශිෂ්‍ය ශිෂ්‍යාවගේ තනි අවශ්‍යයතාව මත පදනම්ව තීරණය කළ යුතුය.
- දෘශ්‍ය අපහසුතා සහිත ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ගැළපෙන ආකෘතියට සැකසු ප්‍රශ්ණ පත්‍රයක් ලබානොදෙන අවස්ථා වලදී, එම ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්ණය බොහෝ වාර ගණනක් එම ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඉල්ලා සිටින පරිදි, අමතර පැහැදිලි කිරීම් වලින් තොරව ඔවුනට ඇසෙනසේ කියවිය යුතුය.
- වෙනම විශේෂ කාමරයක් තුල විභාගය ලිවීම සඳහා අවශ්‍ය පහසුකම් ලබාදිය යුතුය. එහිදී පටිගත කරන ලද විභාග ප්‍රශ්න හෙඩ්ෆෝනයක් භාවිතා කිරීම තුලින් දෘශ්‍ය අපහසුතා ඇති ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ඇසීමට සැලැස්විය යුතුය.
- ශිෂ්‍ය ශිෂ්‍යාවන් වර්තමානයේදී පාසල් වැඩ කටයුතු සඳහා පන්තිකාමරය තුල එදිනෙදා භාවිතා කරන උපකරණ විභාග සඳහා ද භාවිතා කිරීමට අවස්ථාව ලබාදිය යුතුය. එය ඔවුනට ඇති දෘශ්‍ය අපහසුතා මගහරවා ගැනීමට උපකාර වේ. මෙහිදී එම ශිෂ්‍ය ශිෂ්‍යා වන්ට සම්ප්‍රදායික පෑන සහ කොලයක් භාවිතා කිරීමට අපහසු නම් ඔවුන්ගේ පිළිතුරු හඬ පටිගත කරන උපකරණයක් මගින් හෝ පරිගණකයක් මගින් පටිගත කරගත යුතුය.

- හඬ පටිගත කිරීමේ උපකරණයක් සපයා නොමැති අවස්ථාවකදී හෝ විභාගයට සහභාගිවන දෘශ්‍ය අපහසුතා ඇති ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඔවුන්ගේ පිළිතුරු  දෙනු ලබන පරීක්ෂකවරයෙකු  විසින් අසා ලියාගැනීමට කැමැත්ත පළකර සිටින විට ඒ සඳහා අවශ්‍ය සුදුසු පහසුකම් සැලසිය යුතුය.
- දෘශ්‍ය අපහසුතා ඇති සිසුවෙක් හෝ සිසුවියක් වීඩියෝ දර්ශණ අන්තර්ගතවූ විභාගයකට මුහුණ දීමට සිදුවුවහොත් එම වීඩියෝ දර්ශණ විශාල තිරයක ප්‍රදර්ශනය කිරීමට නොහැකි වන  අවස්ථාවකදී  වඩාත් ගැළපෙන දෘශ්‍ය මාධ්‍යයක් උදාහරණයක් ලෙස පුද්ගලිකව පරිහරණයට සුදුසු පරිගණකයක් එම ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත සැපයිය යුතුය.

# ශ්‍රවණ අපහසුතා-

- ශ්‍රවණ අපහසුතා ඇති ශිෂ්‍ය ශිෂ්‍යාවන් ශ්‍රවණය හා සම්බන්ධ විභාග පරීක්ෂණ වලින් නිදහස් කිරීම හෝ  ඒ වෙනුවට විකල්ප විභාග ක්‍රමවේදයක් භාවිතා කිරීමේ යෝග්‍යතාවය, උදාහරණයක් ලෙස මුහුණට මුහුණ සම්මුඛ සාකච්ඡාවක් ලෙස විභාගය පැවැත්වීම, සම්බන්ධව  උපදෙස් උපදේශක කමිටුව විසින්  රාගම වෛද්‍ය පීඨයේ අබාධිතතා අධ්‍යන අංශයේ ශ්‍රවනවේදියෙකු ගෙන් සහ කථන හා භාෂා චිකිත්සකවරියක ගෙන් ලබාගත යුතුය.
- ශ්‍රවණ පරීක්ෂණයක් ද අන්තර්ගත විභාගයකදී ඉදිරිපත් කරනු ලබන ශ්‍රවණ පරීක්ෂණ කොටස මධ්‍යස්ත ප්‍රමාණයේ ශ්‍රවණ ඌනතාවක් ඇති ශිෂ්‍යයෙකුට ශිෂ්‍යාවකට විභාග ශාලාවේදී ඇසීමට අපහසුනම් එම ශ්‍රවණ පරීක්ෂණ කොටස ශ්‍රවණ අපහසුතා ඇති  ශිෂ්‍යාට හෝ ශිෂ්‍යාවට හෙඩ්ෆෝනයක් තුලින් ඇසීමට සැලැස් වියයුතුය.

.

- පෞද්ගලිකව භාවිතා කරන හඬ පටිගත කිරීමේ උපකරණය පෞද්ගලික ප්‍රේරණ ලූපයකට අනුයුක්තව භාවිතා කල හැකි ස්ථානයකදී, එම ශ්‍රවණ විභාගය ශ්‍රවණ ආබාධ සහිත සිසුන් සඳහා ප්‍රධාන විභාග  ශාලාවේදී පැවත් වීය හැක.

- ශ්‍රවණ අබධිතාවයක් ඇති සිසුවෙක් හට විභාගයට අසන යෙදීමේදී  සුපරීක්ෂක ආසන්න ආසන ඉදිරිපත්කළහැක.

# කායික අපහසුතා-

• පෞද්ගලික රෝද පුටු භාවිතා කිරීම ඇතුළුව විශේෂ ආසන විභාගයේදී ලබාදීම සලකා බලනු ඇත.

- සිසුවෙකුට කියවීමට පැහැදිලි අත්අකුරු නිෂ්පාදනය කිරීමට දුෂ්කරතාවන් ඇතිනම් හෝ ලිවීමේදී මන්දගාමී වේගයක් තිබේනම්, මෙම සිසුන් හට ආධාරක හා අනුවර්තික උපකරණ ලිවීම සඳහා යොදා ගතහැක. වෙනස් පෑන් සහ පැන්සල්, පිළිතුර පටිගතකිරීම, වචන පැසුරුම් සහ වෙනත් පරිගණක හා තාක්ෂණික අධාරික උපකරණ වල සහය ලබාගත හැක.
- විභාගයට සහභාගිවන කායික අපහසුතා ඇති ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඔවුන්ගේ පිළිතුරු දෙනු ලබන පරීක්ෂකවරයෙකු විසින් අසා ලියාගැනීමේ ක්‍රමවේදය තෝරා ගත හැක.
- ශාරීරික ආබාධ සහිත සිසුවෙකුට ඔහුගේ / ඇයගේ පිළිතුර ලේඛනගත කිරීමට අවශ්‍ය නම් එවිට ලියනෙකු/ විනයධරයෙකු ඔවුන්ගේ පිළිතුරු ලිවිම සඳහා තෝරාගත හැක. මුහුණට මුහුණ සම්මුඛ පරීක්ෂණ සඳහා වර්ධන හෝ විකල්ප සන්නිවේදන (AAC) උපාංගය භාවිතාකිරීම හෝ Viva voce ඇගයීම, කතාව, භාෂාව සහ / හෝ සන්නිවේදනය දුෂ්කරතාවන් ඇති සිසුන් සඳහා අවසර දිය හැක. එවැනි අවස්ථාවකදී උපදෙස් කථන සහ භාෂා චිකිත්සක / ශ්‍රවණවෙදියෙකුගෙන් ගනු ලැබෙනු ඇත.

- විනයධරයෙක්/ලියනෙක් හෝ පටිගත කිරීමේදී උපකරණ පිළිතුරු ලේඛන ගතකිරීම සඳහා භාවිතාකිරීමේදී සිසුවාට එක් පැයකට විනාඩි 15 අතිරේකව හිමිවනුඇත.

- වෘත්තීය චිකිත්සකයෙකු විසින් කරන ලද විධිමත් තක්සේරුවක් පෙර ඉදිරිපත් කිරීම මගින් අවශ්‍යය කරන සාධාරණ පහසුකම් විභාගයේදී සිසුවාට දීමට තීරණය කමිටුව විසින් තීරණය කරනු ඇත.

# වචන අන්ධතාව-

- සිසුවෙකුට වචන අන්ධතාව (Dyslexia ) ඇති බවට තහවුරු වී තිබේ නම් අමතර කාලයක් ඔහුගේ / ඇයගේ අවශ්‍යතා මත ලබාදිය හැක.
- විභාග ප්‍රශ්ණ පත්‍රය, මාර්ගෝපදේශ සහ/හෝ පැවරුම වචන අන්ධතාව (Dyslexia) ඇති සිසුවෙකු හට භාවිතා කිරීමට හැකිලෙස (උදා: අකුරු ප්‍රමාණය, එම කඩදාසි පසුබිම් වර්ණය) ඉදිරිපත්කළ හැකිය.

# මනෝවිද්‍යාත්මක / මානසික සෞඛ්‍ය අපහසුතා

සිසුවෙක් හට විභාගයට මුහුණ දීමේදී බලපෑම් ඇතිවෙන ලෙස මනෝවිද්‍යාත්මක / මානසික සෞඛ්‍ය අපහසුතා ඇති නම් එම සිසුවාට පහත පහසුකම් සදහා මනෝ වෛද්‍යවරයෙකුගේ නිර්දේශයෙන් පසුව ඉල්ලුම් කල හැක.

- විශේෂ ආසන සැකසුම්.
- ඖෂධ ලබාගැනීමේ පහසුකම්.
- විවේකය
- අමතර කාලය
- විශේෂ පහසුකම් - ලියන්නේකුගේ/විනයධරයකුගේ සහය හෝ Word Processor හෝ ආධාරක පරිගණක මෘදුකාංග වල සහය.
- කාල පරතරයක් සහිත විභාග පැවැත්වීම.
- ඖෂධ වලින් ඇතිවිය හැකි අතුරු අබාධ පිළිබඳව සැලකිලිමත් වීම.
- විභාගය පවත්වන වෙලාව.

සිසුවා විසින් මෙම පහසුකම් සදහා සාක්ෂි ලෙස, ප්‍රතිකාර කරනු ලබන උපදේශක මනෝ වෛද්‍යවරයෙකුගේ සහතික ඉදිරිපත් කල යුතුය . අදාල පාර්ශව සදහා පමණක් සිසුවාගේ කැමැත්ත ඇතිව රහසිගත භාවය තහවුරු කරමින් එම ලේඛන ඉදිරිපත් කල යුතුය.

# වෛද්‍යමය අවශ්‍යතා

- වෛද්‍යමය හේතු මත බෙහෙත්, අහාර හෝ යම් පානයක් සිසුවාට නියමිත වෙලාවකට ගැනීමට අවශ්‍යය නම් අධීක්ශණය යටතේ කෙටි විවේක ලබාදිය හැක.

- විවේක කාලය සදහා ලබාදුන් කාලය වෙනුවට විනාඩි 20ක් දක්වා අමතර කාලයක් විභාගය වෙලාවේදී ලබාදිය හැක.

# පාරිසරික අවශ්‍යතා

- විශේෂ අසන පහසුකම් අවශ්‍ය වන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට එම අවශ්‍ය උපකරණ භාවිතා කිරීමට ඉඩ ලබාදිය යුතුය. උදාහරණ ලෙස පුටු සහ ලියන මේස.

# අභියාචනා

උපදේශක කමිටුව විසින් විභාග කළයුතු යෝජනා සමඟ නොසතුටට පත් සිසුන් හට අභියාචනයක් ඉදිරිපත් කළහැකිය. සියළුම අභියාචනා සාධාරණ පහසුකම් ලබාදීමේ ප්‍රතිපත්තිය තුල සලකා බැලිය යුතුවේ.

**<u>යොමුව/පිවිසුම</u>**

- Convention on the Rights of Persons with Disabilities
- Accessed at: http://www.un.org/disabilities/convention/conventionfull.shtml
- Irish Education System
- Accessed at: http://www.gov.ie
- http://www. examination.ie
- Specific Language Difficulties
- Accessed at: http://www.bdadyslexia.org.uk